**ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූනි 06 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථා, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධාන, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 980.00 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 937.04 ක් උපයෝජනය කර තිබිණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 42.96 ක් හෙවත් සියයට 4.38 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබිණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 771.00 | 763.20 | 7.80 | 1.01 |
| මූලධන | 209.00 | 173.84 | 35.16 | 16.82 |
| **එකතුව** | **980.00** | **937.04** | **42.96** | **4.38** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 29 ක් හා දෙපාර්තමේන්තු 17 ක් විසින් එකතුව රු.මිලියන 3,503ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 2,448ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු. මිලියන 1,055ක් හෙවත් සියයට 30ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමා**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 27801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 53.00 | 52.82 | 40.00 | 45.98 | 220.00 | 158.62 |

## 2.2 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ තැන්පත් ගිණුම් 07කට අදාළව 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 551.11 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6003/0000/00/0054/0000/000 | (2.29) |
| 6000/0000/00/0002/0056/000 | 1.62 |
| 6000/0000/00/0013/0043/000 | 2.36 |
| 6000/0000/00/0018/0013/000 | 33.12 |
| 6000/0000/00/0001/0042/000 | 4.36 |
| 6000/0000/00/0016/0011/000 | 317.32 |
| 6000/0000/00/0017/0002/000 | 194.62 |
| **එකතුව** | **551.11** |

**2.3 විගණන නිරීක්ෂණය**

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත් ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබිණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශනය**

සැසඳුම් ප්‍රකාශනය පරිදි එදිනට අයවීම් හිඟහිටි ශේෂවල එකතුව රු. 2,614,964කි. ඉන් රු.90,050 ක් වර්ෂ 08 කට වැඩි කාලයක සිටද, රු.333,795ක් වර්ෂ 4 ක සිට වර්ෂ 8 ක් අතර කාලයක සිට ද, රු.2,191,119 ක් වර්ෂ දෙකකට අඩු කාලයක සිට පැවැත එමින් තිබුණ ද, එම ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.2 පොදු තැන්පත් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 හා 2013 වර්ෂවලට අදාළව ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති 02කින් ලබාගත් රු.335,900 ක රඳවුම් මුදල් නිදහස් කිරීමකින් හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ආ) කලවාන හා ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ප්‍රජා සමිති මගින් ඉටු කරවාගෙන තිබුණු කොන්ත්‍රාත් නිම කිරීමෙන් පසු ඇතිවිය හැකි දෝෂ වෙනුවෙන් එකතුව රු.93,273 ක මුදලක් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. අදාළ වගකීම් කාලය ඉක්මවී තිබුණත්, එම කාර්යාල විසින් අදාළ රඳවාගත් මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිදහස් කිරීමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (අ) මුදල් රෙගුලාසි 177 හා 382 | 425,180 | කුරුවිට, කහවත්ත හා ඇලපාත යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දෛනිකව එකතු වන මුදල් අවස්ථා 30ක දී දින 2 ක සිට දින 7 ක් දක්වා කාලපරාසයක ප්‍රමාදයකින් පසුව බැංකුවේ තැන්පත් කර තිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 395(ඌ) | - | කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බැංකු සැසඳුම් සැකසීම, චෙක්පත් ලිවීම හා සිගාස් වැඩසටහන මගින් වාර්තා යැවීම එක් නිලධාරිනියක් වෙත පවරා තිබුණි. |
| (ඇ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධනය කරන ලද මුදල් රෙගුලාසි 371 | 332,950 | විවිධ කාර්යයන් සඳහා ලබා ගත් තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ කාර්යය නිම කර දින 10 ක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත්, ඇඹිලිපිටිය, ඉඹුල්පේ, කහවත්ත හා ඇලපාත යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තත්කාර්ය අතුරු අග්‍රිම 23ක් දින 11 ක සිට දින 80 ක් දක්වා කාල පමාවකින් පසුව පියවා තිබුණි. |

## 3.4 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

**ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ ව්‍යාපෘති**

නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ ව්‍යාපෘති ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබුණු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) රත්නපුර දිස්ත්‍රික් ලේකම් බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද චක්‍රීය ණය වැඩසටහන සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම චක්‍රිය ණය වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් විසින් ලබාගත් ණය වාරික 10 කින් ආපසු ගෙවිය යුතු වුවත්, ඇඹිලිපිටිය, කුරුවිට හා ඉඹුල්පෙ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රතිලාභීන් විසින් වාරික ගෙවීමට ඉඩ දුන් කාලය ඉක්මවා එකතුව රු.110,353 ක් වර්ෂ 1½ ක සිට වර්ෂ 07 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම ණය ශේෂය අයකර ගැනිමට කාර්යාල අපොහොසත් වි තිබුණි.

(ii) රත්නපුර හා ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වූ චක්‍රීය ණය ගිණුම්වල 2014 වර්ෂයේ සිට අඛණ්ඩව පැවැති සාමාන්‍ය ශේෂය රු.1,068,260 කි. එම මුදල් ශේෂයෙන් ප්‍රතිලාභින්ට ණය ලබා දීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් එම මුදල් ශේෂ බැංකු ගිණුම්වල නිෂ්කාර්යව පැවැතිණි.

(iii) ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වූ සමිතියක හිටපු භාණ්ඩාගාරික විසින් චක්‍රිය ණය වැඩසටහනට අයත් රු.43,700 ක් වංචා කර තිබුණි.

(ආ) ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය විසින් ආබාධිතයින් සඳහා වන නිවාස ආධාර වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණි. එම වැඩසටහන යටතේ කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම මහ ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කළ ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය අනුමත කර නොතිබුණි. මේ නිසා 2010 වර්ෂයේ සිට 2016 අගෝස්තු මාසය දක්වා එම වැඩසටහන යටතේ එක් ප්‍රතිලාභියෙකුට රු.80,000 ක් පමණක් ගෙවා තිබුණි.

(ඇ) දැනට පවතින ජාතික හැඳුනුම්පත වෙනුවට විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමට 2014 වර්ෂයේදී සැලැසුම් කර තිබුණ ද, ඒ අනුව කටයුතු කිරීමට පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පියවර ගෙන නොතිබුණු නිසා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදු කළ පහත සඳහන් වියදම් නිෂ්ඵල වී තිබුණි.

(i) ඇඹිලිපිටිය හා ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලද අයදුම්පත්, උපදෙස් පත්‍රිකා, බැනර්, තීන්ත හා අවශ්‍ය උපාංග තොග විශාල ප්‍රමාණයක් වර්ෂ දෙකක පමණ කාලයක සිට 2016 අගෝස්තු මාසය වන විටත් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිෂ්කාර්යව පැවැතුණි.

(ii) එම ව්‍යාපෘතිය සඳහා නිලධාරීන් පුහුණු කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක් විසින් රු.214,370 ක් වැය කර තිබුණු අතර ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 03 ක කාලයක් ගත වී තිබුණ ද, එක් විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් හෝ පිළියෙල කර නොතිබුණි.

(ඈ) කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් 2010 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු කිතුල් නිෂ්පාදන සංවර්ධන වැඩසටහන, කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ලියාපදිංචිය සඳහා අයදුම් පත්‍ර 510 ක් ලැබී තිබුණ ද, 2016 මැයි මාසය වන විටත් හැඳුනුම්පත් 22 ක් හෙවත් සියයට 4 ක අඩු ප්‍රමාණයක් නිකුත් කර තිබුණි.

(ii) තීරණය කළ පරිදි, කිතුල් නිෂ්පාදන කාර්මිකයන් සඳහා කිතුල් පැළ ලබා දී නොතිබුණු අතර 2012 වර්ෂයේදී ඔවුන් වෙත ආර්ථික උපකරණ කට්ටලයක් නොමිලේ ලබා දීමට තීරණය කර තිබුණ ද, එය ද ඉටු කර නොතිබුණි.

(iii) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් කිතුල් නිෂ්පාදන කාර්මිකයින් වෙනුවෙන් 2011 ජනවාරි මාසයේ සිට බල පැවැත්වෙන පරිදි ආරම්භ කර තිබුණු "රන්දිය" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා කිතුල් නිෂ්පාදන කාර්මිකයින් කිසිවෙකු ඇතුළත් කිරීමට පියවර ගෙන නොතිබුණි

(ඉ) කලවාන, වේවැල්කඳුර සේවා පියස කාර්යාලයේ ඉදි කිරීම් 2010 වර්ෂයේදී රු.205,900ක් වැය කර ආරම්භ කර තිබුණ ද, 2016 මැයි මාසය වන විටත් නිම කර නොතිබුණි.

(ඊ) 2015 වර්ෂයේදි ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදනවලින් කිරිඇල්ල ප්‍රදේශයේ ගර්භණී මාතාවන්ට පෝෂ්‍යදායී ආහාර ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණි. 2015 වර්ෂය අවසාන වන විට ලැබී තිබුණු ප්‍රතිපාදනවලින් රු.1,984,000 ක් හෙවත් සියයට 37 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබණි. 2015 මාර්තු මාසයේ සිට අගෝස්තු මාසය දක්වා පමණක් පෝෂණ මළු බෙදා දීම සිදු කර තිබුණි. එමෙන්ම, කුරුවිට ප්‍රදේශයේ වූ ප්‍රතිලාභීන් 1225 දෙනෙකුගෙන් ප්‍රතිලාභීන් 700 දෙනෙකුට පමණක් පෝෂණ මළු ලබා දී තිබුණි. එම ආහාර මළු නිසි ප්‍රමිතියෙන් යුතු බවට වගකිවයුතු නිලධාරියකු විසින් තහවුරු කර නොතිබුණි.

(උ) කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ තරුණ කෘෂි ව්‍යවසායකත්ව මෙහෙයුම වැඩසටහන යටතේ කෘෂි ව්‍යවසායකත්ව දිස්ත්‍රික් සංසදය පිහිටුවීම හා දිස්ත්‍රික්කයේ හොඳම කෘෂි ව්‍යවසායකයා තෝරාගෙන සහතික ප්‍රදානය කළ යුතු වුවත්, එසේ සිදු කර නොතිබුණි. එමෙන්ම, වාණිජ ගොවිපළ වැඩසටහන - 2015 යටතේ වාණිජ ගොවිපළ දිස්ත්‍රික් සංසදය පිහිටුවා නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා කාන්තා කාර්යංශය විසින් ක්‍රියාත්මක කළ වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ණය නිකුත් කිරීම 2013 දෙසැම්බර් මාසයේ සිට අත්හිටුවා තිබුණි. ඒ සඳහා පවත්වා තිබුණු ඉතිරිකිරීම් ගිණුමේ රු.109,585 ක මුදල් ශේෂය එදින සිට 2017 පෙබරවාරි මාසය වන විටත් ඌන උපයෝජිතව පැවැතිණි.

(එ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා නොදිම නිසා ආපදා සහන සේවා කටයුතුවල පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(i) ඇලපාත ප්‍රදේශයේ 2014 හා 2015 වර්ෂවල සිදු වූ නිවාස හානි සඳහා ගෙවිය යුතු රු.3,424,000 ක ප්‍රතිලාභ 2016 දෙසැම්බර් මාසය වන විටත් ගෙවිමට නොහැකි වී තිබුණි. එමෙන්ම, බාදනයට ලක් වූ අක්කර 35 ඉඩම් යායට යන මාර්ගය හා පලාවෙල පන්සල මාර්ගයේ කැඩුණු පැති බැම්ම පිළිසකර කර නොතිබුණු අතර, නාය යාමේ අවදානමට ලක් වී තිබුණු ගිරිපාගම ගම්මානය හා නිරිඇල්ල, බටකඩ, පලාවෙල යන ග්‍රාම නිලධාරී වසම්වල ආපදාවට පත් වූ නිවාස වෙනුවෙන් කිසිදු ආරක්ෂිත පියවරක් ගෙන නොතිබුණි.

(ii) කහවත්ත ප්‍රදේශයේ 2014 හා 2015 වර්ෂ තුළ වූ නිවාස හානි සඳහා ගෙවිය යුතු රු.1,796,100 ක ප්‍රතිලාභ ගෙවීමට 2017 ජනවාරි මාසය වන විටත් ප්‍රමාද වී තිබුණි. එමෙන්ම, ඇන්දාන ප්‍රදේශයේ මධ්‍ය අවදානම් සහිත නිවාස 20 ක් පැවතුණි. ඊට පිළියමක් ලෙස ඇන්දාන වතු සමාගමේ ඉඩම් ලබා ගැනීමට 2016 අගෝස්තු මාසය වන විටත් නොහැකි වී තිබුණි.

(iii) කුරුවිට ප්‍රදේශයේ 2014 හා 2015 වර්ෂවල සිදුවූ ආපදා හේතුවෙන් නිවාස හානි සඳහා රු.327,914 ක් 2017 ජුනි මාසය වන විටත් අදාළ ප්‍රතිලාභින් වෙත ගෙවා නොතිබුණි.

(ඒ) ඉඹුල්පේ, කට්ටඩිකන්ද මාර්ගය පිළිසකර කිරීමේදී ඇස්තමේන්තුගත වැඩ විෂයයන් 22 කින් රු.288,484ක් වූ වැඩ විෂයන් 02 ක් පමණක් ඉටු කර තිබුණි. ඒ අනුව රු.751,518 ක්වූ ඉතිරි

සියලු ඉදි කිරීම් ඉටු කර නොතිබුණි. මේ නිසා ගිවිසුම පරිදි වැඩ අත්හැරීමේ අලාභ වශයෙන් රු.220,805 ක් අදාළ කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගෙන නොතිබුණි.

(ඔ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05ක් තුළ ඉටු කරන ලද කර්මාන්ත 15 ක නියැදියක් පරික්ෂා කිරීමේදී එම කර්මාන්තවල නිසි පරිදි ඉටු නොකළ එකතුව රු.1,927,253 ක වැඩ විෂයයන් පැවැතුණි.

## 3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අර්ධ ගෝලාකාර වහලයක් සහිත 75' x 30' x 20' ප්‍රමාණයේ තහඩු ආවරණයක් රු.436,500 ක් ප්‍රජා සංසදයකට ලබා දී තිබුණි. එවැනි විශාල තහඩු ආවරණයක අවශ්‍යතාව එම සංසදය විසින් පැහැදිලි නොකළ අතර එය ගබඩා කළ හැකි ස්ථානයක් ද එම සංසදයට නොතිබුණි.

(ආ) 1992 පෙබරවාරි 18 දිනැති අංක 7/92 හා 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලට පටහැනිව, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තියේ නිලධාරිනියක වූ රත්නපුර සහකාර දිස්ත්‍රික් ලේකම් විසින් රජයේ වාහන පෞද්ගලික භාවිතය සඳහා යොදා ගෙන තිබුණි. ඇය විසින් භාවිතා කර තිබුණු වාහන දෙකකට මාස 29 ක් තුළ එකතුව රු.110,142 ක් ඉන්ධන සඳහා වැය කර තිබුණි.

එම අවභාවිතාව සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 8.2 උප වගන්තිය පරිදි අවශ්‍ය විනයානුකූල පියවර ගැනීම සඳහා එම පරිච්ඡේදයේ 1.4 උප වගන්තිය ප්‍රකාරව අදාළ විනය බලධාරියා වෙත වාර්තා කිරීමටද පියවර ගෙන නොතිබුණි.

(ඇ) වාර්ෂික බදු පදනම මත පුද්ගලයින් භුක්ති විඳින ඉඩම් කොටස් සමාගමකට බදු දීම සඳහා එසේ භුක්ති විඳින බවට වූ තොරතුරු සඟවා බදු දීමේ අවසරය ඉඩම් කොමසාරිස්වරයාගෙන් ලබා ගැනීමට කුරුවිට ප්‍රාදේශීය ලේකම් කටයුතු කර තිබුණු බව රත්නපුර දිස්ත්‍රික් ලේකම්වරයාගේ ලිපියක් මගින් තහවුරු විය. තොරතුරු සඟවා ලබාගත් අවසරය මත රජයේ ඉඩමක පදිංචිවීමේ වාර්ෂික අවසර පත්‍රයක් පිළියෙල කර තිබීම, රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමුවන උපලේඛනයේ (12) ඡේදය පරිදි කූට ලේඛන පිළියෙල කිරීමක් ලෙස නිරීක්ෂණය විය. ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 8.2 උප වගන්තිය පරිදි අවශ්‍ය විනයානුකූල පියවර ගැනීම සඳහා එම පරිච්ඡේදයේ 1.4 උප වගන්තිය පරිදි අදාළ විනය බලධාරියා වෙත වාර්තා කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

## 3.6 අවිධිමත් ගනුදෙනු

--------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය වූ රජයේ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියෙන් බැහැරව සිදු කළ එවැනි ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශයට පටහැනිව ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2014 හා 2015 වර්ෂවල ලංසු විවෘත කිරීමේ දිනය ප්‍රසිද්ධ නොකර

ලංසු විවෘත කළ අවස්ථා ප්‍රමාණාත්මක සංඛ්‍යාවක් පැවතුණි. එමෙන්ම ඉඹුල්පේ, කහවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අවස්ථා 45ක දී ලංසු 04 කට වඩා අඩු ප්‍රමාණයකින් කැඳවා තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.2.1(අ) හා 5.6 මාර්ගෝපදේශ ප්‍රකාරව ලංසුකරුවෙකුට අවශ්‍ය සියලු තොරතුරු හා පිරිවිතර පැහැදිලිව නිශ්චිත ලෙස ඉදිරිපත් කළ යුතුව තිබුණි. එහෙත් 2014 හා 2015 වර්ෂවලදී කහවත්ත හා ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රසම්පාදන කමිටු විසින් ලංසු සමාලෝචනය කරන අවස්ථාවේදී අවශ්‍ය පිරිවිතර තීරණය කිරීමේ පිළිවෙතක් අනුගමනය කළ අවස්ථා පැවතිණි.

(ඇ) ඉඹුල්පේ හා කහවත්ත යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(අ) මාර්ගෝපදේශයට පටහැනිව 2015 වර්ෂයේ අවස්ථා 11 කදී අදාළ පිරිවිතර සම්පූර්ණ කළ අවම මිල ලංසුව ප්‍රතික්ෂේප කර එකතුව රු.387,914 ක් වැඩි මිල ලංසුව ඉදිරිපත් කළ ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පියවර ගෙන තිබුණි.

## 3.7 කළමනාකරණ දුර්වලතා

---------------------------

රත්නපුර දිස්ත්‍රික්කයේ විදාතා සම්පත් මධ්‍යස්ථානය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතා අනාවරණය විය.

(අ) 2014 ඔක්තෝබර් මාසයේ සිට 2016 ජුලි මාසය දක්වා මාස 22 ක කාලය තුළ රත්නපුර විදාතා මධ්‍යස්ථානය මගින් පවත්වන ලද පුහුණු වැඩමුළු සංඛ්‍යාව 62ක් වී තිබුණි. මාසිකව වැඩමුළු පැවැත්වීමේ සාමාන්‍ය 2.8 කි. එම කාලය තුළ වූ මුළු වියදම රු.3,628,654ක් වී තිබුණි. ඒ අනුව, එක් පුහුණු වැඩමුළුවක පිරිවැය රු.58,527ක් වූ බැවින් ඒක ප්‍රතිලාභී පිරිවැය රු. 2,058 ක් වැනි අධි අගයක් ගෙන තිබුණි.

(ආ) රත්නපුර විදාතා මධ්‍යස්ථානයේ පුහුණු වැඩසටහන් සඳහා 2005 වර්ෂයේදී අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු.65,000ක් වූ එළවළු විජලන යන්ත්‍රය සහ රු.35,000ක් වූ බේකරි උදුන 2016 දෙසැම්බර් 31 දින වන විට වර්ෂයකට වැඩි කාලයක සිට අභාවිතව පැවතුණි.

(ඇ) ඇඹුල්දෙණිය විදාතා මධ්‍යස්ථානයට ලබා දුන් එක් පරිගණකයක් 2009 මාර්තු 08 දින සොරුන් විසින් රැගෙන ගොස් තිබුණි. මේ සම්බන්ධව එදින රත්නපුර පොලිසියට කළ පැමිණිල්ල හැර වෙනත් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

(ඇ) ඇලපාත විදාතා සම්පත් මධ්‍යස්ථානය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් කිසිදු පුහුණු වැඩසටහනක් 2016 මැයි මාසය වන විටත් පවත්වා නොතිබුණි. මේ නිසා එම කාලය වෙනුවෙන් වැය කර තිබුණු ගොඩනැගිලි කුලිය රු. 901,385ක් නිෂ්ඵල වී තිබුණි.

## 3.8 නිෂ්ඵල වියදම්

---------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අඩුපාඩු පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) කලවාන, දෙල්ගොඩ නැගෙනහිර ජනපදය බහුකාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීමේ දී අත්‍යවශ්‍ය වූ රු.315,484ක වැඩ විෂයයන් හතක් අතහැර ඇස්තමේන්තු සකස් කර තිබුණි. පසුව එම ඉදි

කිරීමේ දී ඉටු කළ යුතු රු. 327,537 ක තවත් වැඩ විෂයයන් 05ක් ද ඉටුකර නොතිබුණි. මේ නිසා අරමුණුගත කාර්යය නිසි පරිදි ඉටු කර නොතිබුණු අතර අදාළ ගොඩනැගිල්ල අවභාවිතා වන බව ද ස්ථානීය පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(ආ) කිරිඇල්ල දෙහෙරගොඩ ගල්පොත්ත දියවර ගම්මානයේ ක්‍රීඩාපිටිය සකස් කිරීමට රු.75,604 ක් වැය කර තිබුණි. එය ක්‍රීඩා පිටියක් සඳහා භාවිතා කිරීමට හැකියාවක් නොතිබුණි.

(ඇ) එක ගමකට එක වැඩක් වැඩසටහන යටතේ, 2014 වර්ෂයේදී ඉඹුල්පේ සිදු කළ ව්‍යාපෘති 03ක ඉදිකිරීම් නිම කර නොතිබුණි. ඒවා නිම කිරීමට අවශ්‍ය මුදල් 2016 සැප්තැම්බර් මාසය වන විටත් ලැබී නොතිබුණි. මේ නිසා එම ව්‍යාපෘති අත්හැර තිබුණු අතර අදාළ ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කර භාවිතයට ගන්නා තෙක් ඒ සඳහා වැය කළ රු. 1,145,861 ක් නිෂ්ඵල වී තිබුණි.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක් විසින් ඉටු කළ කර්මාන්ත 03ක් වෙනුවෙන් රු.53,251ක් වැඩිපුර ගෙවා තිබුණි. එමෙන්ම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක් මගින් සිදුකළ කර්මාන්ත 07ක ඉටු නොකළ වැඩ වෙනුවෙන් රු. 422,353ක් ගෙවා තිබුණි.

### 3.9 පාඩු හා හානි

---------------

රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය කැබ් රථයකට 2015 ජනවාරි මාසයේදී සිදු වී තිබුණු අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව, මූලික පරීක්ෂණය සිදු කිරීමට අනතුර සිදු වී දින 13 ක් පමා වී තිබුණි. එසේම එහි ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කිරීමට මාසයක කාලයක් ප්‍රමාද කර තිබුණි. පූර්ණ වාර්තාව ලබා ගැනීම සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීමට මාස 09ක් කල්ගත කර තිබුණු අතර එම පරීක්ෂණ මණ්ඩල වාර්තාව රත්නපුර ප්‍රාදේශීය ලේකම් වෙත අනතුර සිදු වී මාස 21ක ප්‍රමාදයකින් පසුව 2016 ඔක්තෝබර් 15 දින ලබා දී තිබුණි.

### 3.10 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 59 | 53 | 06 | - |
| (ii) | තෘතියික මට්ටම | 41 | 25 | 16 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,902 | 1,780 | 122 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 179 | 180 | 05 | 01 |
| | **එකතුව** | **2,181** | **2038** | **144** | **01** |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

බඳවාගත් අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.